# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2117/26 – 2019 අප්‍රේල් 03 වැනි බදාදා – 2019.04.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2017/07.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩබ්. ජයන්ත වීරසිරි මයා, අංක A 58-2, දැහැමි සෙවන, අල්ගොඩ, දෙහිඕවිට.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

කැළණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැළණිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,


1A – G29805 – 11 (2019/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242, ඕබඩගේ ලීලාරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මාර්තු මස 26 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2017/07 .

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩබ්. ජයන්ත වීරසිරි මයා, අංක A 58-2, දැහැමි සෙවන, අල්ගොඩ, දෙහිඕවිට.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

කැළණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැළණිය.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''කැලණිය විශ්වවිද්‍යාලයේ කම්කරු (III ශ්‍රේණිය) තනතුරක සේවය කරන ලද ඩබ්. ජයන්ත වීරසිරි මයාගේ සේවය 2014.05.19 දිනැතිව අවසන් කිරීම අසාධාරණ හා අයුක්ති සහගත වන්නේ ද? එසේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද'' යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 09 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

04-574

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.